# චිරස්ථායි කෘෂි කර්මාන්තයේ දියුණුව ගොවිපල් පොහොර සැකසීම

පහසුවෙන් සිදුකර ඉක්මණින් ප්‍රතිඵල ලබා ගැනීම සැම සිද්ධියකටම යහපත් වන්නේ නැත. සමහර අවස්ථාවලදී අපහසු වුවත් එය වඩාත්ම ගැලපෙන දේ නම්, එය සිදු කිරීමෙන් විශ්වාස කල නොහැකි යහපත් ප්‍රතිඵල ලබා දෙයි. "අපහසුවෙන් විශාල කන්දක් නැගීමෙන් පහසුවෙන් බැසයාමට වැඩි දුරකින් පල්ලමක් හිමිවේ"

අද කෘෂි කර්මාන්තයේ යෙදී සිටින ශ්‍රී ලාංකික ගොවි මහතුන්ගෙන් වැඩි පිරිසක් නිවැරදි අවබෝධයෙන් තොරව සැමදේම පහසුවෙන් කිරීමට පෙළඹීම තුළින් සමහර අවස්ථා වලදී දීර්ඝකාලීන අයහපත් බලපෑම් වලට ලක්වන්නේ අවාසනාවන්ත අයුරින්ය. ඉවක් බවක් නොමැතිව පොළවට හෙලන රසායනික පොහොර සම්භාරය නිසා බොහෝ අයහපත් අයුරින් පස පරිහානියට පත්වේ. පසේ පාරිසරික සමතුලිතාවය බිඳ වැටේ.

බොහෝ දුරට පස යොද ගන්නේ ගොවිතැන් කටයුතු ඉටු කිරීමටයි. විශේෂයෙන් බෝග සිටුවා අස්වනු නෙලීමටයි. වැඩි වැඩියෙන් විශාල අස්වනු නෙලීමටයි. විශාල අස්වනු ලබා ගැනීමට සරුපසක බෝග සිටුවිය යුතුයි. නමුත් දිගින් දිගටම බෝග වගා කිරීම නිසා පස නිසරු වී යයි. නිසරු පසේ වගාකර විශාල අස්වනු බලාපොරොත්තුව වගා කටයුතු සිදුකර ප්‍රතිඵලයක් නැතිවම හුල්ලමින් බලා සිටිති. නැවත වියදම් කර එසේ ගොවිතැන් නොයෙලෙති. තව තවත් ඉඩම් මුඩු ඉඩම් බවට පත්වෙමින් පවතී.

මෙයට පිළිතුරු සොයාගත යුතු දැවැන්ත ප්‍රශ්ණයකි. පිළිතුරු සොයාගත යුතු අති දැවැන්ත ප්‍රශ්ණයකි. වගා කටයුතු සිදුකිරීමෙන් ඇතිවන වාසිය අඩුවීමට හේතුවන ගැටළු අතර පස නිසරුව පැවතිම, එසේත් නැත්නම් පස සරු කිරීමට වර්තමානයේ සිදු කරන අලස ක්‍රියා මාර්ග වලට යොදවන වියදමට අනුකූලව අස්වනු නොලැබීම සියළුම කාරණා අතරින් ප්‍රධාන තැනක් ගනී.

එච්.එම්.වී.ඒ.ජී. ජයලත් බණ්ඩා
කථිකාචාර්යය
උද්‍යාන භෝග පුහුණු හා සංවර්ධනය
මධ්‍යස්ථානය - බිබිල

මෙම ගැටළුවට සාර්ථකම පිළිතුර නම් පස සරු කිරීමයි. පස සරු කරන්නේ කෙසේද? නිවැරදිව චිරස්ථායි ලෙස පස සරු කරන්නේ කෙසේද? මේවාට ගැලපෙන පිළිතුරු කිහිපයක් තිබිය හැක. එම පිළිතුරු අතර වඩාත්ම ප්‍රචලිත, සුලභ නමුත් මහා කම්මැලි වැඩකට නැති දෙයක් ලෙස සමහරෙක් සිතන සේ පසට කාබනික පොහොර එක් කිරීමයි. එසේ සිතන වගාකරුවනට, ඔවුන්ගෙ දරුවනට ඔවුන්ගේ ඉඩම පැවරිය හැක්කේ සාරය පෙරා ඉතිරි වන රොඩු මෙන් වටිනාකමින්, සාරවත් බවින් හීන, මුඩු ඉඩමක්ය. (නමුත් එම ගොවි මහතුන්ගේ ඉඩම් නිසි අයුරින් සාරවත් කර, බීජයක් විසිකල පමණින් පැලවී අස්වනු ලබා දෙන පොළවක් ඔවුනගේ දරුවනට දයාද කිරීමට හැකිවන අයුරින් කටයුතු ඉටු කිරීමට වගකිවයුතු අප සැමගේම වගකීමක් වන්නේය.) ඔවුනගේ දිරිය

වැඩුණු දැත් වලට, සියලුම කටුක පරිසර වලින් බැටකෑ අපට බත සපයන ඔවුනගේ මනසට මේ කටයුත්ත තවදුරටත් හුරු කළ යුතුය.)

කාබනික පොහොර පමණක් වගාවන් සඳහා භාවිතා කිරීම යථාර්තවාදී නොවන්නේය. රසායනික පොහොරද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත ප්‍රමාණයන් ගෙන් පසට එක්කළ යුතුයි. මක්නිසාද වගාවක් මගින් පසෙන් උදුරා ගන්නා ශාක පෝෂක ප්‍රමාණය දිගින් දිගටම වගා කිරීම නිසා පසෙන් ඉවත්ව යයි. වගාවක් සිදුකර ප්‍රශස්ත අස්වැන්න ලබා ගැනීමට රසායනික පොහොර එක් කිරීමේ වරදක් නැත. වරද වන්නේ රසායනික පොහොර පමණක් එක් කිරීමයි.

1. පසේ නිසියාකාරව නිතරම තෙතමන ප්‍රමාණය රඳවා ගැනීමට අපහසු නිසාත්, වියදම් සහගත නිසාත්, බෝගයක් වගා කිරීමෙන් ලැබිය යුතු අස්වැන්නෙන් කොටසක් අවම වේ.

2. රසායනික පොහොර යෙදුවත්, දින කිහිපයකින් පසේ මුල් කලාපයේ නොරැඳී ඉවත්ව යයි. මේ නිසා ශාකයට අවශ්‍ය සම්පූර්ණ පෝෂක ප්‍රමාණය (ගසේ මුල මණ්ඩලය පවතින කලාපයේ දිගින් දිගටම නොරැඳී) අඩුවී ලැබිය යුතු අස්වැන්නෙන් තවත් කොටසක් අඩුවේ.

3. යූරියා, T.S.P, M.O.P රසායනික පොහොර වලින් ලබා දෙන්නේ පෝෂක කිහිපයක් පමණි. බෝගයක් වර්ධනයට සහ එල දැරීමට මූලද්‍රව්‍ය 16 ක් අවශ්‍යයි. මේ නිසා සමබල ලෙස බෝග ය වර්ධනයට මූලද්‍රව්‍ය වැඩි ගණනක් අඩංගු පොහොරක් අවශ්‍යයි.

4. සමහර පස් ස්වභාවයෙන්ම තද ස්වභාවයක් ගනී. සමහර විට ප්‍රාත්ති සකසා පැළ සිටුවීමෙන් හෝ වැපිරීමෙන් පසු පස්වල වැලි සහ මැටි එක්වී, තද ස්ථරයක් සාදයි. මේ නිසා බෝග පැලය දැඩි ආතතියකට ලක්වේ. මේ නිසා බෝග පැළෑටි දුර්වල වී අස්වැන්න අඩුවේ.

ඉහත කාරණය ලෙස සඳහන් කරන ලද්දේ ලබා ගැනීමට හැකි උපරිම අස්වැන්න නැතිවී යාමට හේතු වේ. මෙයට අමතරව තව තවත් කාරණා තිබිය හැක. නමුත් එම හේතු අනිවාර්යයෙන්ම විසඳගත හැකි මට්ටමක පවතී.

1. කාබනික පොහොර මිශ්‍ර පසක් කාබනික පොහොර අමිශ්‍ර පසකට වඩා වැඩි කාලයක් තෙතමනය රඳවා තබා ගනී.

2. කාබනික පොහොර වල ඇති හියුමස් නම් ද්‍රව්‍යයේ අඩංගු කලිල කොටස් නිසා පසට එක්කරන පොහොර වර්ග (පෝෂක) බෝගයට ක්‍රම ක්‍රමයෙන් ලබාගත හැකි අයුරින් රඳවා තබා ගනී. මුල මණ්ඩලය අවට කලාපයෙන් ඉවත්වීම අවම කරයි.

3. කාබනික පොහොරවල බොහෝ විට අඩු ප්‍රමාණයකින් වුවත් පෝෂක වර්ග රාශියක් පවතී. මේවා පසට එක්කිරීම මගින් ක්ෂුද්‍ර පෝෂක රාශියක් පසට එකතු වේ.

4. කාබනික පොහොර, පස තදවීම, සිමෙන්ති බවට හැරීම අවම කරයි. පස ස්පොන්ජිමය ස්වභාවයකට පත් කරයි. වාතනය දියුණු කරයි. මුල් පද්ධතිය හොඳින් වැඩෙයි.

වෙනත් අයුරකින් ප්‍රකාශ කලවිට පසේ භෞතික රසායනික සහ ජෛව විද්‍යාත්මකව පස දියුණු කරයි. ඒ පිළිබඳව තවදුරටත්

විද්‍යාත්මකව විමසා බැලිම වටිනා කාරණයක් වනු ඇත.

1. පසේ භෞතික තත්ත්වය දියුණු කරයි.

සරලව ප්‍රකාශ කලවිට පසේ වාතය තිබීමට ඇති ඉඩ ප්‍රමාණය, පසේ වර්ණය, පසේ ජලය රැඳීමට ඇති ඉඩ ප්‍රමාණය, පස සෝදා යාමට විරුද්ධව පස් අංශු අතර බැඳී පවතින ශක්තිය යනාදිය, බෝගයක් යහමින් වැඩීමට බලපායි. ඉහත කාරණය බෝග යක් වැඩීමට ගැලපෙන ලෙස සකස් කිරීමට, සමතුලිත කිරීමට කාබනික පොහොර සමත්ය.

වැලි වැඩියෙන් ඇති පසක් නම් එම වැලිකැට අතර ඇති අනවශ්‍ය ලිහිල් බව නිසා ජලය රඳවා තබාගත නොහැකියි. පස් අංශු එකිනෙකට බැඳීමේ හැකියාවක් කාබනික ද්‍රව්‍ය යෙදීමෙන් සිදුවේ. එසේම එකිනෙකට හිරවී බැඳී ඇති මැටි අංශු සහිත පසකට කාබනික ද්‍රව්‍ය එක් කිරීමෙන් පසේ වාතය අවශ්‍ය තරම් ගබඩා කරගත හැකි ලිහිල් ස්වභාවයකට පත් කරයි. අවශ්‍ය තරම් වාතය රැස්කර ගැනීමට අවකාශ සපයයි.

ගසක් වැඩීමට ගසට ජලය අවශ්‍යයි. එසේම මුල්වල ස්වසනයට සහ ගසේ වැඩීමට ගැලපෙන ලෙස පසේ සමහර තත්ත්වයන් සකස් වීමට වාතය අවශ්‍ය වේ. අවශ්‍ය තරමට ජලය සහ වාතය පසේ ගබඩාකර තැබීමට හැකියාවක් කාබනික පොහොර සතුව ඇත.

තාපය අවශෝෂණය කර ගැනීමේ හැකියාව පසට ලබාදීමට කාබනික පොහොර සමත්ය. පසේ උෂ්ණත්වය වැඩිවන විට මුල්වල ක්‍රියාකාරීත්වය වැඩිවේ. මුල්වල වර්ධනය උපරිම වේ. හොඳ මුල් පද්ධතියකින් කියා පාන්නේ හොඳ අස්වැන්නක් ලබාදෙන ශාකයක ලක්ෂණ වේ. එසේම වැඩිපුර ජලය රැස්වීමක් මුල් අවට සිදු නොවේ. අමතර ජලය පස තුළින් බැස ඉවත්ව යයි. එසේ කාබනික ද්‍රව්‍ය යෙදූ පසේ වැඩ කටයුතු කිරීම පහසු වේ. භාෂ්මික පස් මෙන්ම ලවණ සහිත පස්වල වගා කිරීමේදී ශාකවලට ඇතිවන අයහපත් බලපෑම අවම කරයි.

2. පසේ රසායනික තත්ත්වය දියුණු කරයි.

කොම්පෝස්ට් පොහොර හෝ ගොම්පල් පොහොර නිපදවීම ඇත්තේ ශාක කොටස් මගින්ය. එම ශාක කොටස්වල ශාක වලට අවශ්‍ය සියළුම පෝෂක තිබේ. විශේෂයෙන්ම ශාක වලට අවශ්‍ය නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් සහ කැල්සියම් මේවායේ පවතින්නේ කාබනික සංයෝග ලෙසයි. මේවා දිරාපත් වන විට ශාකවලට ලබාගත හැකි තත්ත්වයට පත් කරයි. එලෙසම කාබනික පොහොර දිරාපත් වන විට $Co_2$ නිකුත් වෙයි. මෙම වායුව ජලය සමඟ එක්ව කාබනික අම්ලය සාදයි. මෙම දුර්වල අම්ලය නිසා පසේ තිබෙන පෝෂක වල දියවීම වැඩිකර ගසට නිරන්තරයෙන් උරා ගැනීමට සුදුසු පරිදි සකස් කර තබයි. එසේම ක්ෂුද්‍ර පෝෂකද (කුඩා ප්‍රමාණ වලින් අවශ්‍ය පෝෂක) සෑහෙන පමණ පසට එක්කරයි.

3. පසේ ජෛව රසායනික ලක්ෂණ දියුණු කරයි.

ඇත්ත වශයෙන්ම කාබනික පොහොර, විශේෂයෙන් කොම්පෝස්ට් පොහොර සහ ගොම්පල් පොහොර බැක්ටීරියා සහ දිලිර වැනි ක්ෂුද්‍ර ජීවීන් කෝටි ප්‍රකෝටි ගණනින් අඩංගු මිශ්‍රණයකි. මේවා පසට එක් කිරීම තුළින් පසට මේ ක්ෂුද්‍රජීවීන් එක්වනවා මෙන්ම පසේ සිටින ක්ෂුද්‍රජීවීන්ගේ ක්‍රියාකාරීත්වයද වැඩි කරයි. මේ ක්ෂුද්‍ර ජීවීන් පසේ සිදුවන ක්‍රියාවලි වේගවත් කරයි. උදහරණයක් ලෙස ඇමෝනිකරණය, නයිට්‍රිකරණය, නයිට්‍රජන් තිරකිරීම වැනි ක්‍රියා දැක්විය හැක. මෙම

ක්‍රියාවලින් පසේ සරුසාරබව ඉතාමත් අත්‍යාවශ්‍යයි. මේ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට ඉහත ක්‍රියාවලි කිහිපයක් සලකා බැලීම, වටිනාකම තේරුම් ගැනීමට වැදගත් වේ.

**ඇමෝනිකරණය:**

ඇමෝනිකරණ බැක්ටීරියා නමින් හඳුන්වන බැක්ටීරියා කාණ්ඩය මෙම ක්‍රියාවලියට උදව් වෙයි. නයිට්‍රජන් පෝෂකය අඩංගු පොහොර සරල නයිට්‍රජනීය ද්‍රව්‍ය බවට හරවයි. පසට එක්කරන කාබනික පොහොර නිසා මෙම ක්‍රියාවලිය සීඝ්‍රවත් වේ.

**නයිට්‍රීකරණය:**

මෙහිදී පසේ අනෙකුත් ක්‍රියාවලින් නිසා ඇතිවන ඇමෝනියා අයන, නයිට්‍රේට් ($No_3$) අයන බවට පත් කරයි. මෙම බැක්ටීරියා ජීවත් වන්නේ හොඳින් වාතනය වූ පස් වලයි. පසේ වාතය රැඳෙන ඉඩ ප්‍රමාණය මේ සඳහා කෙලින්ම බලපායි. පසට එක්කරන කාබනික ද්‍රව්‍යවල මෙම බැක්ටීරියා අධිකව ජීවත්වන අතර, කාබනික ද්‍රව්‍ය පසට එක් කිරීම නිසා පසේ කලින් පැවති මෙම බැක්ටීරියා වලද ක්‍රියාකාරීත්වය වැඩි කරයි.

මෙයට අමතරව නයිට්‍රජන් තිර කරන ක්ෂුද්‍ර ජීවීන්ද කාබනික ද්‍රව්‍ය සමඟ පසට එක්වන අතර, මේ නිසා වායුගෝලයේ ඇති නයිට්‍රජන් (ශාකයට ප්‍රයෝජනයට ගත නොහැක.) ශාක වලට ප්‍රයෝජනයට ගත හැකි වනසේ පස තුළ ගබඩා කරයි.

ඉහත ජෛවීය ක්‍රියා නොතිබෙන්නට පසට යොදන යූරියා පොහොර, පසට එකතුවන අපද්‍රව්‍ය එලෙසම පවතිනු ඇත. යූරියා ලෙස මුල් මගින් ශාකයට අධිශෝෂණය (උරා ගැනීම) කිරීම අපහසුය. අප විසින් පසට යොදන යූරියා පොහොර ශාකවලට අධිශෝෂණය (උරා ගැනීම) කර ගැනීමට හැකිවන පරිදි වෙනස් කරන්නේ පාංශු ජීවීන් මගිනි. කොම්පෝස්ට් හෝ ගොම්පල පොහොර එක්කිරීම තුළින් රසායනික පොහොර සඳහා දරණ ලද වියදමට උපරිම ප්‍රතිඵල ලබාගත හැක. එසේම කාබනික පොහොර වල ශාක වර්ධනය කිරීමට බලපාන හෝමෝනද ස්වල්ප වශයෙන් අඩංගු බව සොයාගෙන ඇත.

එසේම පසට යොදන රසායනික පොහොර වලින් ලැබෙන පෝෂක හෝ පසේ පවතින පෝෂක පසෙන් ඉවත් නොවන පරිදි රඳවා තබාගෙන ශාක මුල්වලට ලබාදීමේ හැකියාවක් කාබනික පොහොර වල ඇති කලිල කොටස් වලට හැකියාවක් ඇති බව නැවත මතක් කිරීම වැදගත් යයි සිතමි. මෙතරම් වාසි ගෙන දෙන කාබනික පොහොර පසට නොයොදන්නේ ඇයි? රසායනික පොහොර මෙන්ම කාබනික පොහොරද භාවිතයෙන් උපරිම අස්වැන්න ගෙන ආශ්වාදය ලැබීමට බොහෝ දෙනෙක් යොමු නොවන්නේ ඇයි?

කාබනික පොහොර භාවිතයේදී වැඩිපුරම භාවිතා කරන කාබනික පොහොර වර්ගය වන්නේ ගොම්පල් පොහොරයි. මෙකී සටහනේ අරමුණ වන්නේ නිවැරදි ආකාරයට එම පොහොර සකසා ගන්නා ආකාරය සහ භාවිතයට සූදානම් කරගන්නා ආකාරයයි. වැදගත්කම අවබෝධ කර ගැනීමට අඩංගු ද්‍රව්‍ය වල ගුණාගුණ පිළිබඳ සටහනක්ද ඉදිරිපත් කෙරේ.

ගොම්පල් පොහොර ලෙස හඳුන්වන්නේ ගොම්පල් සතුන්ගේ (ගවයන් එළුවන්) මල, මුත්‍රා කෑමෙන් පසු ඉතිරිවන සත්ත්ව ආහාර සහ විශේෂයෙන් එළදෙනුන්ට නිදා ගැනීමට අතුරනු ලබන ද්‍රව්‍ය ආදිය එකට දිරාපත් කර ගැනීමෙන් ලබා ගන්නා පොහොරයි. විශාල වශයෙන් ප්‍රයෝජනයට ගන්නා ගොම්පල්

පොහොර වර්ගය මෙය වේ. ඒ සමඟම වඩා ජනප්‍රිය කාබනික පොහොර වර්ගයද වේ.

ගොවිපල් පොහොරවල අඩංගු ද්‍රව්‍ය අතර මළද්‍රව්‍ය, මුත්‍රා, අනෙකුත් අපද්‍රව්‍ය වේ. සත්ත්ව මළ ද්‍රව්‍ය වල වටිනා ශාක පෝෂක අඩංගු වේ. අළුත් ගොම වල 70% - 80% ජලය වේ. මෙම ද්‍රව්‍ය වල නොදිරූ ජලයේ දිය නොවන ආහාර ද්‍රව්‍ය අඩංගු වේ. ඒ සමඟම ආහාර මාර්ගයෙන් නිකුත් වන ජීර්ණ යුෂ, ආහාර මාර්ග වල මියගිය පටක අඩංගු වේ. ආහාරයට ගන්නා විවිධ ද්‍රව්‍ය අනුව ගොවිපල් පොහොරවල අඩංගු පෝෂක (නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම්) ප්‍රමාණය වෙනස් වේ. නයිට්‍රජන් සහ පොටෑසියම් වැඩිපුර ප්‍රමාණයක් මුත්‍රාවල අඩංගු වන අතර, වැඩිපුර පොස්පරස් ප්‍රමාණයක් මළවල අඩංගුයි.

ගොවිපල් පොහොර වලට එකතුවන අනෙකුත් කොටස අපද්‍රව්‍යමය දේ වේ. මේවා සතුනගෙ නිද ගැනීමට යොදන ද්‍රව්‍ය වේ. මේවා මගින් බොහෝ විට මළ සහ මුත්‍රා උරාගනී. සතුන් පිරිසිදුව සහ පහසුවෙන් සිටීමට උදව් වෙයි. මේ සඳහා පිදුරු, කොළ අතු, ඉරුම් කුඩු, සාමාන්‍යයෙන් යොද ගනී. මේවා පොහොර සකසන විට එක්කර ගත යුතුයි. බොහෝ විට කෑමෙන් පසු ඉතිරිවන දේද සතුනට නිදග ැනීම සඳහා භාවිතා කරයි.

**නිවැරදි ක්‍රමයට ගොවිපල් පොහොර සැකසීම**

වාෂ්පවීම සහ ජලය මගින් දියවී (වණීවට හසුවී) පොහොර වලින් වැඩි ප්‍රමාණයක් පෝෂක ඉවත්වී අපතේ යයි. මෙය වළක්වා ගැනීම සඳහා ක්‍රමවත්ව ගොවිපල් පොහොර සැකසිය යුතුයි. මේ සඳහා අඩි 20-25 පමණ දිගටද, අඩි 5-6 පළලටද, අඩි 3- 3 1/2 ගැඹුරටද කාණුවක් සකසා ගත යුතුයි.

සෑම දිනම සවස ගොවිපලේ ඉවත් කරන අපද්‍රව්‍ය වියළි පස් තාච්චියක් සමඟ කලවම් කර ගවයා නිදගන්නා ස්ථානයේ විසිරුවා හල හැක. මේ නිසා මේවාට මුත්‍රා උරා ගැනීමක් සිදුවේ. මෙම ද්‍රව්‍ය විශේෂයෙන් ගොම සහ මුත්‍රා වැටෙන ස්ථානවල විසිරුවා හල යුතුයි. සෑම උදෑසනකම මෙම මිශ්‍රණය සහ ගව මළ සමඟ හොඳින් කලවම් කර පොහොර වලට/කාණුවට එක් කල හැක.

පළමුව කාණුවේ කොනක සිට අඩි 03 පමණ කොටසක ගොඩ ගසා ගත හැක. මෙම ගොඩ පොළව මට්ටමේ සිට අඩි 1 1/2-2 පමණ ගොඩ සෑදුනු පසු ගොඩ දගැබක් ආකාරයට මුදුන් කල යුතුයි. පසුව ගොම සහ පස් මිශ්‍රණයක් යොදගෙන නිරාවරණය වූ ගොඩ ආවරණය කල යුතුයි. මාස 03 කින් පමණ ගොඩ පාවිච්චියට ගත හැක. මේ ගොඩ සකසා අවසන්වූ පසු කාණුවේ තවත් අඩි 03 යොදගෙන ගොඩක් සකසා ගත හැක. ගවයන් 3 - 4 දෙනෙක් සිටින ගොවිපලකට මෙවන් කාණු 2 ක් පමණ අවශ්‍යය.

මේ ක්‍රමයට ඝන අඩි 300 ක පමණ (ට්‍රැක්ටර් ලෝඩ් 03) පොහොර ප්‍රමාණයක් එක ගවයෙකු ගෙන් වසරකට නිපදවා ගත හැක. මෙම පොහොර පරිහරණයට ගන්නා විට කාණුවකට T.S.P කිලෝග්‍රෑම් 30 - 40 යොද ගත හැක. මේ ආකාරයට කාබනික පොහොර වලට T.S.P එක් කිරීමෙන් වාසි කිපයක් සැලසේ.

1. ගොවිපල් පොහොර වලින් ඇමෝනියා ආකාරයට නිදහස් වන නයිට්‍රජන් ප්‍රමාණය අඩුවේ.
2. පොහොර වල ඇති පොස්ෆරස් ප්‍රමාණය වැඩි වීමක් සිදුවන අතර, මෙය සමතුලිත පොහොරක් බවට පත් කරයි.
3. ආම්ලික පස්වලදී ගසට අධිශෝෂණය (අවශෝෂණය) කරගත හැකි

තත්ත්වයේ පවතින පොස්ෆරස් ශාකයට අධිශෝෂණය (අවශෝෂණය) කරගත නොහැකි තත්ත්වයට පත් කරයි. නමුත් කාබනික පොහොර සමඟ එක්වූ පොස්ෆරස්, ආම්ලික පස් (pH අගය අඩු) වල පවා වලට අධිශෝෂණය කරගත හැකි තත්ත්වයේ පවතී.

ඒ කෙසේ වෙතත් පොහොර වල වර්ෂාවට අසුවීමෙන් වළක්වා ගත යුතු අතර, වලට පිටතින් ජලය ගලා ඒම වළක්වා ගැනීමට කටයුතු කළ යුතුයි. නැතහොත් පොහොර ගොඩේ ඇති පෝෂක සේදී ඉවත්ව යා හැක.

මේ සඳහා වලට ආවරණයක් සැකසිය හැකි. වල වටේට ගැට්ටක් සකසා වර්ෂාවෙන් වල තුළට ජලය ගලා ඒම වළක්වා ගත හැක.

තවත් ක්‍රමයකට සත්ත්ව බහිස්‍රාවී ද්‍රව්‍ය වලින් අපතේ යන පෝෂණ අඩු කිරීමට (ගව මුත්‍රා පොළවට උරාගැනීම වැළැක්වීමට) සිමෙන්තියෙන් කාණු සකසා සිමෙන්තියෙන්ම සැකසූ වලකට යොමු කර ඒවා දිනපතා ගොම පොහොර වලට එකතු කල හැක.

## නිතර පීඩා කරන හතර දෙනෙක්

අවිධෙයො භෘත්‍යජනඃ - ශඨානි මිත්‍රාණ්‍ය දයකඃ ස්වාමි
අවිනය වතිච භාර්‍යා - මස්තක ශූලානි චත්වාරි

කීකරු කමක් නැති සේවක ජනයාත්, කපටි මිත්‍රයාත්, ඕනෑ කරණ තැනදී නොදෙන ස්වාමියාත්, හික්මීමක් නැති භාර්‍යාවත්, යන සතර දෙනා, නිතර ඔලුවෙහි ඇණෙන උල් වැනි වෙත්, හෙවත් මොවුහු නිතර පීඩාකාරී වෙත්. මොවුන්ගෙන් නිතරම ඇතිවන්නේ දුක් කරදර රාශියකි.

කීකරු කමක් නැති සේවක ජනයාද
කපටි මිතුරු සහ නොදෙනා හිමියාද
නොහික්මුණු බිරිඳ සහ ගුණ නොමැති හොඳ
ඔලුවෙහි ඇනෙන උල් සතරකි නිතර තද